## 2024-03-18 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියරගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානයේ කිගාලි සංශෝධනයට අනුරූප ජාතික වගකීම් ඉටු කිරීම**

හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියරගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානයේ කිගාලි සංශෝධනය ශ්‍රී ලංකාව විසින් 2018 වර්ෂයේදී අපරානුමත කරනු ලැබ ඇත. ඒ අනුව, 2024-01-01 දින සිට හයිඩ්‍රොෆ්ලෝරොකාබන් ආනයන අපනයන වෙළෙඳාම සහ පරිභෝජනය අදියරගතව සීමා කිරීම සඳහා ශ්‍රී ලංකාව නෛතිකව බැඳී සිටී. එකී නෛතික බැඳීමට අනුගත වෙමින් මොන්ට්‍රියල් සන්ධානයේ කිගාලි සංශෝධනයේ ජාතික වගවීම්වලට අනුරූප වන සේ හයිඩ්‍රොෆ්ලෝරොකාබන් ශුද්ධ රසායන ද්‍රව්‍ය සහ එම රසායන ද්‍රව්‍ය අඩංගු මිශ්‍රණ ශ්‍රී ලංකාවට ආනයනය හා පරිභෝජනය අදියරගතව සීමා කිරීමටත්, හයිඩ්‍රොෆ්ලෝරොකාබන් පරිභෝජනය කෙරෙන කෘෂි, ධීවර, සෞඛ්‍ය, සංචාරක, ප්‍රවාහන, කර්මාන්ත, නිවාස හා ඉදිකිරීම් ආදී කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අහිතකර බලපෑම් ඇති නොවන පරිදි හයිඩ්‍රොෆ්ලෝරොකාබන් ආනයන වෙළෙඳාම වාර්ෂික ආනයන කෝටා ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් පරිසර අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා හංගේරියානු රජය අතර ක්‍රීඩා හා ක්‍රීඩා අධ්‍යාපනය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

ක්‍රීඩා හා ක්‍රීඩා අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කරමින් දෙපාර්ශ්වය අතර සහයෝගිතාව වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා හංගේරියානු රජය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ සඳහා වන කෙටුම්පත් අවබෝධතා ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. 'උරුමය' වැඩසටහන යටතේ පූර්ණ අයිතිය සහිත නිදහස් දීමනා පත්‍ර ලබා දීමට අදාළ තොරතුරු ලබා ගැනීම සහ තරුණ ව්‍යවසායකයන් මිලියනයක් බිහි කිරීමට අදාළ වැඩසටහන යටතේ තරුණ ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු සමස්ත දිවයිනම ආවරණය වන පරිදි එක්රැස් කිරීමට අදාළ දීප ව්‍යාප්ත වැඩසටහන**

දැනට රට තුළ පවුල් මිලියන 2කට ආසන්න ප්‍රමාණයකට ඔවුන් භුක්ති විඳින ඉඩම් සඳහා දීමනා පත්‍ර/අවසර පත්‍ර ලබා දී ඇත. 'උරුමය' වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළදී එකී දීමනාපත්‍රලාභීන්ට සහ අවසරපත්‍රලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබා දීමට සැලසුම් කර තිබේ. එමෙන්ම, සමස්ත දිවයින තුළ තරුණ ව්‍යවසායකයින් මිලියනයක් බිහි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර ඇත. මෙම වැඩසටහන් ද්විත්වය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු දිවයිනේ ග්‍රාම නිලධාරි වසම් 14,022ම ආවරණය වන පරිදි ජාතික තරුණ සේවා සභාවේ යොමුන් බලකාය යොදවා ගෙන අදාළ කොට්ඨාසයන්හි ග්‍රාම නිලධාරින්ගේ ද සහාය ඇතිව එක්රැස් කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවතින යාන්ත්‍රණය උපයෝගී කර ගෙන අවශ්‍ය තොරතුරු රැස් කර 'උරුමය' වැඩසටහන සහ තරුණ ව්‍යවසායකයින් මිලියනයක් බිහි කිරීමේ වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් වෙන්ව සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව රාජ්‍ය ව්‍යවසායක් ලෙස ස්ථාපිත කිරීම**

ශ්‍රී ලංකාවේ එකම ඉන්ධන පිරිපහදුව වන සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව 1969 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර, පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුමෙන් 25%ක් පමණ එම පිරිපහදුව විසින් සපයනු ලබයි. අදාළ පිරිපහදුව යාවත්කාලීන කර තවත් වසර 25ක පමණ කාලයක් භාවිත කිරීම පිණිස නිරණාත්මක ආයෝජනයක් සිදු කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ආයෝජනයන් දේශීය සහ විදේශීය පුද්ගලික අංශ මඟින් සපයා ගැනීමට හැකි වන පරිදි සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව වෙනම රාජ්‍ය ව්‍යවසායයක් ලෙස ස්ථාපනය කිරීම යෝග්‍ය බව පෙනී ගොස් ඇත. ඒ අනුව, සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් වෙන් වූ රාජ්‍ය ව්‍යවසායයක් ලෙස ස්ථාපිත කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනත සංශෝධනය කිරීම

1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා පදනම, තිරසර සංවර්ධනය, සමාජ ඒකාබද්ධතාවය, සමාජ ආර්ථික සංවර්ධනය, යහපාලනය, ව්‍යවසායකත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ විෂයයන් පිළිබඳව පුහුණු සහ දැනුවත් සේවා සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරනු ලබයි. මේ වන විට ශ්‍රී ලංකා පදනම මගින් සහතික පත්‍ර පාඨමාලාවේ සිට උසස් ජාතික ඩිප්ලෝමා දක්වා වූ විවිධ පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන අතර, වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි එම පදනමේ අරමුණු හා පරමාර්ථ මෙන්ම බලතල හා කාර්යයන් ද සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. ඒ අනුව, කටයුතු කිරීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා පදනම් පනත සංශෝධනය කිරීම පිණිස ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ පරමාර්ථ සපුරාලීම සහ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් මුළුමනින්ම සාක්ෂාත් කර ගැනීම පිණිස දැනට පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ නායකයින්ගේ හා වෙනත් අදාළ පාර්ශ්වයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව නිර්දේශ සහිත වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරනු ලැබ තිබේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් 160දෙනෙකු අදාළ මැතිවරණ කොට්ඨාසයේ ඡන්දදායකයින් විසින් සෘජුවම තෝරාපත් කර ගැනීමටත්, ඉතිරි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 65දෙනා සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව ජාතික හෝ පළාත් මට්ටමින් තෝරා ගැනීමටත් එකී කමිටුව වෙත අදහස් ඉදිරිපත් කර ඇති අතර, බහුතරයක් විසින් ඒ සඳහා එකඟතාව පළ කර ඇත. ඒ අනුව, මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සඳහා අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ද සැලකිල්ලට ගනිමින් අවශ්‍ය නීති කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සඳහා සංශෝධන

ප්‍රාථමික අධිකරණයක් විසින්, ඉඩමකට බලපාන ආරවුලකදී සිවිල් අධිකරණයක කාර්යය වන භුක්තිය හෝ සන්තකයේ අයිතිය තීරණය කිරීම හෝ පිළිබඳව අවසාන විනිශ්චය ලබා දෙන තෙක් නිවාරක හෝ යාවත්කාලික ක්‍රියාමාර්ග ගැනීම පමණක් සිදු කරනු ලබයි. අයිතිවාසිකම් තීරණය කිරීමේදී දිසා අධිකරණයක් විසින් අවසන් තීන්දුව ලබා දෙන තෙක් ප්‍රාථමික අධිකරණය විසින් ප්‍රදානය කරන ලද නියෝගය ක්‍රියාත්මක වන බැවින් ද, දිසා අධිකරණ තීරණ අභියාචනා අවස්ථා දෙකකට යටත් වන බැවින් ද මෙහිදී නොවැළැක්විය හැකි ප්‍රමාදයන් සිදු වන අතර, එම තත්ත්වය මත යම් ඉඩමකට අනවසරයෙන් ඇතුළු වූවකුට හෝ අනවසර පදිංචිකරුවකුට පවා සැලකිය යුතු කාලයක් අදාළ ඉඩම් තමා සන්තකයේ තබා ගැනීමට හැකියාව ලැබේ. එබැවින්, 1980 අංක 49 දරන පනතින් සංශෝධිත 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය මඟින් අපේක්ෂිත අරමුණු වඩාත් ඵලදායී අයුරින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත (සිතාසි නිකුත් කිරීම හා භාර දීම)

කුරියර් සේවාව සහ විද්‍යුත් තැපැල හරහා සිතාසි භාරදීමේ ක්‍රමයන් ද සාමාන්‍ය සේවාවන් ලෙස ඇතුළත් කිරීම මඟින් සිවිල් නඩු කටයුතුවලට අදාළ සිතාසි නිකුත් කිරීමේ හා භාර දීමේ ක්‍රියාපටිපාටිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන මෙන්ම වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන තවත් සංශෝධන කිහිපයක් ඇතුළත් කරමින් සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස 2021-10-11 දින සහ 2023-07-31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනා ලදී.

09. **අන්තර් අමාත්‍යාංශයීය සංචාරක කමිටුවක් පිහිටුවීම**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි වර්තමාන පුනර්ජීවනය රටේ ආර්ථික ප්‍රතිසාධනය සහ වර්ධනය උදෙසා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇති බව හඳුනාගෙන ඇති බැවින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා දිගුකාලීන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා වර්ෂයකට අවම වශයෙන් සංචාරකයන් මිලියන 05ක් ගෙන්වා ගැනීම ඇතුළු පියවර රැසක් 2024 අයවැය මඟින් යෝජනා කරනු ලැබ ඇත. සංචාරක කර්මාන්තයේ බහුවිධ ස්වභාවය සහ එයට අදාළ විවිධ වත්කම්, නීති සහ වගකීම් රාජ්‍ය ආයතන කිහිපයක් අතර බෙදී යන බැවින්, අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා අදාළ ආයතන අතර කාර්යක්ෂම සම්බන්ධීකරණයක් සහ සහයෝගිතාවක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ රාජ්‍ය ආයතනයන්හි නියෝජනයන්ගෙන් යුතුව අන්තර් අමාත්‍යාංශයීය සංචාරක කමිටුවක් පිහිටුවීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2024 යල කන්නය සඳහා ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීම**

2024 යල කන්නයේ වී වගාව සඳහා යූරියා, TSP, සහ MOP යන රසායනික පොහොර පිළිවෙලින් මෙට්‍රික්ටොන් 110,298.1ක්, මෙට්‍රික්ටොන් 27,711.1ක් සහ මෙට්‍රික්ටොන් 33,412.4ක් අවශ්‍ය බව ජාතික පොහොර ලේකම් කාර්යාලය ඇස්තමේන්තු කර තිබේ. ඒ අනුව, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

* 2024 යල කන්නය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම සහ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම මඟින් ද පොහොර ආනයනය කර, පුද්ගලික අංශය සමඟ තරගකාරී ලෙස ගොවීන් වෙත සහනදායී මිලකට පොහොර අලෙවි කිරීම.

  2024 යල කන්නය තුළ වී වගාව සඳහා එක් ගොවියෙකුට වගා කරන ලද උපරිම හෙක්ටයාර 02ක් වෙනුවෙන් හෙක්ටයාරයකට රුපියල් 15,000/- බැගින් වූ මුදලක් මූල්‍ය සහනාධාරයක් ලෙස ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දීම.

* නියමිත සහනාධාර මුදල් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැර කිරීම.

## 11. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම

පසුගිය වර්ෂ කිහිපය තුළ පැවැති ආර්ථික ගැටලු හේතුවෙන් ග්‍රාමීය මට්ටමින් ආරම්භ කර තිබූ සංවර්ධන ව්‍යාපෘති රාශියක් අතරමග අත්හිටුවීමට සිදුව ඇත. එහෙත්, එම ව්‍යාපෘති සඳහා රජය විසින් දැනටමත් සැලකිය යුතු ආයෝජනයක් සිදු කර තිබෙන බැවින්, එකී ව්‍යාපෘති කඩිනමින් නිම කර ඒවායින් අපේක්ෂිත ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට ලබා දිය යුතුව තිබේ. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දැනට වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අදාළ ප්‍රදේශවල දැනටමත් අතර මැද අත්හිටුවා ඇති ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ග්‍රාමීය මට්ටමින් අතරමග නවතා දැමීමට සිදුව ඇති සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීම පිණිස තවත් රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ සලසා දීමටත්, ජනාධිපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ සංවර්ධන මූලාරම්භයන් සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදන තවත් රුපියල් මිලියන 1,000කින් වැඩි කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. ඉන්දීය රජයේ අරමුදල් යටතේ ආගමික ස්ථාන සඳහා පියැසි පාදක සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම

ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් ලබා දෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක ණය පහසුකම් යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක සීමාවකට යටත්ව, ආගමික ස්ථානවල පියැසි පාදක සූර්ය විදුලිබල පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා 2024-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු ආයතනයක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවා ඇති අතර, ලංසු 06ක් ලැබී තිබේ. තාක්ෂණික ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ සැලකිල්ලට ගෙන, පියැසි පාදක සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදනය ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක කොන්ත්‍රාත් මිලකට M/s Premier Energies Ltd වෙත ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන සැලසීම**

2023 වසරේ මුල් භාගයේදී සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළුව දිස්ත්‍රික්ක 25හි පවුල් මිලියන 2.74ක පමණ ප්‍රමාණයක් ආවරණය වන පරිදි එක් පවුලක් සඳහා මාසයකට නාඩු සහල් කිලෝග්‍රෑම් 10 බැගින් මාස දෙකක කාලයක් සඳහා සහල් ලබා දීමට රජය විසින් පියවර ගන්නා ලදී. හඳුනාගත් අඩු ආදායම්ලාභීන්ගේ පෝෂණ මට්ටම පවත්වාගෙන යාමට උපකාරයක් වශයෙන් මෙම වර්ෂයේදී ද එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව පෙනී ගොස් ඇත. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් සම්බන්ධ කර ගනිමින්, දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් හරහා හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් මිලියන 2.74ක් පමණ ආවරණය වන පරිදි එක් පවුලක් සඳහා මාසයකට සහල් කිලෝග්‍රෑම් 10ක් ලබා දීමේ වැඩසටහන මාස දෙකක කාලයක් ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **පාරිභෝගික ජනතාවට සාධාරණ මිලකට බිත්තර ලබා දීම සඳහා අවශ්‍ය බිත්තර ආනයනය කිරීම**

දේශීය වෙළෙඳපොළෙහි බිත්තර මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා 2024-04-30 දින දක්වා අවශ්‍ය බිත්තර ආනයනය කිරීමට 2023-12-18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට බිත්තර මිලියන 18ක් පමණ ආනයනය කර ඇති අතර, උත්සව සමයේ අවශ්‍යතා සඳහා නවත් බිත්තර මිලියන 42ක් පමණ ආනයනය කළ යුතුව ඇති බවට ගණනය කර ඇත. එම බිත්තර ප්‍රමාණය ආනයනය කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ආන්දීය ආයතන වෙතින් මිල ගණන් කැඳවා ඇති අතර. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි අදාළ ප්‍රසම්පාදනයන් ප්‍රදානය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

****************